ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ මෑතකාලීන ප්‍රදානලාභීන් සඳහා ප්‍රිය සම්භාෂණයක්</u>

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ 39 වන අධ්‍යක්ෂ මණ්ඩල හමුවේ ප්‍රදානලාභීන් සඳහා ප්‍රිය සම්භාෂණයක් 2024 ජූනි 13 වන දින කොළඹ, ඉන්දියා හවුස් හිදි පවත්වන ලදී. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, මානව හිතවාදී සහ ව්‍යාපාරික සංවිධාන, මාධ්‍ය ක්ෂේත්‍රයේ නිරතවන්නන් සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් ඇතුළු රැසක් සහභාගී වූහ.

2. 39 වන අධ්‍යක්ෂ මණ්ඩල හමුව 2024 මාර්තු 19 වන දින නව දිල්ලියේදී පැවති අතර ඉන්දියාවෙන් සහ ශ්‍රී ලංකාවෙන් කලාව, ඉතිහාසය, අධ්‍යාපනය, පුහුණුවු සහ සංස්කෘතිය, සෞඛ්‍යය සහ සමාජ සංවර්ධනය යනාදී විවිධ තේමාවන්ගේ ව්‍යාපෘතීන් 16ක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මේ අතරින් ව්‍යාපෘතීන් 10ක් කොළඹ ලේකම් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේදී ක්‍රියාත්මක කරනු ඇත.

3. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් මහ කොමසාරිස්තුමා කුඩා නමුත් පරිවර්තනීය ව්‍යාපෘතීන් සඳහා සහයෝගය ලබාදීමෙහිලා ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ කාර්යභාරය අගය කළේය. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම දෙරට අතර ජනතා කේන්ද්‍රීය සංවර්ධනයේ සහ ආර්ථික සහයෝගීතාවයේ පුළුල් පරාසය පිළිඹිබු කරන බව එතුමා ප්‍රකාශ කළේය.

4. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම ආර්ථික, විද්‍යා, අධ්‍යාපනික, තාක්ෂණික සහ සංස්කෘතික සහයෝගීතාවය ඉහළ නැංවීම තුළින් ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් කිරීම සඳහා සහ දෙරට ජනතාව අතර අවබෝධය

ඉහළ නැංවීම සඳහා 1998 වසරේ දෙසැම්බර් 28 වන දින ඉන්දියානු සහ ශ්‍රී ලංකා රජයන් අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් පිහිටුවන ලදී. පසුගිය වසර 25 තුළ පදනම ව්‍යාපෘතීන් 600කට පමණ සහයෝගය ලබා දී ඇති අතර ඒවායේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 160කට අධිකය. මේ අතරින් ව්‍යාපෘතීන් 360කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලදී.

***

***කොළඹ***
***2024 ජූනි 14***